| | | (8) කුට්ටාපිටිය අංක 2, ගොවිකාරක සභාව | ... 21 ... | 142 |
| | | (9) ගනේගම අංක 2, ගොවිකාරක සභාව | ... 28 ... | 165 |
| | | (10) කරවිට අංක 1, ගොවිකාරක සභාව | ... 31 ... | 217 |

## දෙවන උපලේඛනය

### රක්ෂණ වූ අයගේ විස්තර

(කුඹුරු පනතේ විග්‍රහ කර ඇති අන්දමට)

| | වගාවෙන් ලැබෙන කොටස |
|---|---|
| (i) ඉඩම් හිමි ගොවියා ... ... ... ... | 100 % |
| (ii) ගොවි කුලිකරුවන් යොදන ගොවිතැන් නොකරන ඉඩම් හිමියා ... | 100 % |
| (iii) ගොවි කුලිකරුවන් යොදන බදුකරු ... ... ... | 100 % |
| (iv) අද ගොවියා අඩුව වශයෙන් ... | 75 % |
| (v) අද ගොවීන් ලවා කුඹුරු වැඩ කරන ඉඩම් හිමියා වැඩිම වශයෙන් ... | 25 % |
| (vi) අද ගොවීන් ලවා කුඹුරු වැඩ කරවන බදුකරු වැඩිම වශයෙන් ... | 25 % |

9–387–1

---

## 1961 අංක 13 දරණ වගාරක්ෂණ පනත

### 14(3) වෙනි වගන්තිය යටතේ කරන නිවේදනයයි

ගොවිජන සේවා සහකාර කොමසාරිස්වර නාගමුත්තු පුලේන්දිරන් වන මම, 1961 අංක 13 දරණ වගාරක්ෂණ පනතේ 14 වෙනි වගන්තියේ (3) වන උප වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලය ප්‍රකාර නියමිත සෑම ප්‍රදේශයකම මහ සහ යල් කන්නයන්හි ගොවිතැන් කරන කාල සීමාවන් මෙහි දක්වන උපලේඛනයේ සඳහන් ලෙස විය යුතු බැව් මෙයින් නියම කරමි.

ගොවිජන සේවා දෙපාර්තමේන්තුව,
4, බුලර්ස් පටුමග, කොළඹ 7.
1970 අගෝස්තු මස 30 දින.

ඇන්. පුලේන්දිරන්,
ගොවිජන සේවා සහකාර කොමසාරිස්.

## උපලේඛනය

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ආදයම් නිලධාරි කොට්ඨාශය | මහ කන්නය | | යල කන්නය | |
|---|---|---|---|---|---|
| | | වැපිරීම ආරම්භ කළ යුතු දිනය | ගොයම් කපා අවසාන කළයුතු දිනය | වැපිරීම ආරම්භ කළ යුතු දිනය | ගොයම් කපා අවසාන කළයුතු දිනය |
| 1. කොළඹ ... | (1) සියනෑකෝරළේ බටහිර මැද පත්තුව ... | ජූලි 1 ... | මාර්තු 10 ... | මාර්තු 15 ... | අගෝස්තු 31 |
| | (2) අලුත්කුරු කෝරළය උතුර 'බී' (පහත දක්වා ඇතිවිල යායවල් හැරයි) | ජූලි 1 ... | මාර්තු 20 ... | මාර්තු 15 ... | අගෝස්තු 31 |
| | අංක 139 දෙඹවෙල අස්ගිරිය ගොවිකාරක සභා ප්‍රදේශයේ ඉදල්ලවල යායේ අක්කර 10ක් | මාර්තු 10 ... | පෙබරවාරි 15... | — ... | — |
| | අංක 136 දෙරණගොඩ ගොවිකාරක සභා ප්‍රදේශයේ දෙරණගොඩ විලයායේ අක්කර 50 ක්<br>අංක 155 මාදෙල්ගමුව–සියඹලාපිටිය ගොවිකාරක සභා ප්‍රදේශයේ රත්නක්කාවිල යායේ අක්කර 30 සහ පස්ගම්මන විල යායේ අක්කර 8 ක් ... ...<br>අංක 165 කම්මිට–අස්ගිරි වල්පොල ගොවිකාරක සභා ප්‍රදේශයේ මැදිරිකඩ විල යායේ අක්කර 41 ක් සහ නම්මාවිලයායේ අක්කර 22 ක් ...<br>අංක 168 නැදගමුව කෙහෙල්බද්දර ගොවිකාරක සභා ප්‍රදේශයේ පස්ගම්මන විලයායේ අක්කර 44 ක් ... ... | — ... | — ... | මාර්තු 10 ... | සැප්තැම්බර් 30 |

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ආදයම් නිලධාරි කොට්ඨාශය | මහ කන්නය | | යල කන්නය | |
|---|---|---|---|---|---|
| | | වැපිරීම ආරම්භ කළයුතු දිනය | ගොයම් කපා අවසාන කළයුතු දිනය | වැපිරීම ආරම්භ කළයුතු දිනය | ගොයම් කපා අවසාන කළයුතු දිනය |
| | (3) අලුත්කුරු කෝරළය උතුර ''ඒ'' | ජූලි 1 | මාර්තු 20 | මාර්තු 15 | ඔක්තෝබර් 15 |
| | (4) බටහිර ශේවාගම් කෝරලය | අගෝස්තු 10 | මැයි 31 | මාර්තු 21 | සැප්තැම්බර් 30 |
| | (5) නැගෙනගිර හේවාගම කෝරළය | ජූලි 1 | මාර්තු 30 | මාර්තු 21 | සැප්තැම්බර් 30 |
| | (6) මුත්තැස් ප්‍රදේශ | නොවැම්බර් 15 | මැයි 15 | — | — |
| 2. කලුතර | (1) බටහිර පස්දුන් කෝරළය | ජූලි 15 | මාර්තු 31 | මාර්තු 1 | සැප්තැම්බර් 15 |
| | (2) කලුතර තොටමුණ | ජූලි 15 | මාර්තු 31 | මාර්තු 15 | සැප්තැම්බර් 15 |
| 3. මහනුවර | (1) මැද දුම්බර | ඔක්තෝබර් 5 | අප්‍රියෙල් 15 | මැයි 1 | ඔක්තෝබර් 15 |
| | (2) උඩ පළාත —ගොවිකාරක සභා අංක 80 | අගෝස්තු 1 | අප්‍රියෙල් 15 | මාර්තු 15 | සැප්තැම්බර් 15 |
| | ගොවිකාරක සභා අංක 81, 83, 84 85 සහ 86 | සැප්තැම්බර් 15 | අප්‍රියෙල් 15 | අප්‍රියෙල් 1 | ඔක්තෝබර් 15 |
| | ගොවිකාරක සභා අංක 82, 87, 88 සහ 89 | අගෝස්තු 1 | මාර්තු 31 | මාර්තු 15 | අගෝස්තු 31 |
| | ගොවිකාරක සභා අංක 90, 95, 96, 97 සහ 98 | සැප්තැම්බර් 15 | අප්‍රියෙල් 15 | අප්‍රියෙල් 1 | ඔක්තෝබර් 15 |
| | ගොවිකාරක සභා අංක 91, 92, 93 සහ 94 | ජූලි 15 | අප්‍රියෙල් 15 | අප්‍රියෙල් 1 | ඔක්තෝබර් 15 |
| | ගොවිකාරක සභා අංක 99, 100 සහ 101 | ජූලි 1 | මාර්තු 31 | මාර්තු 1 | ඔක්තෝබර් 15 |
| 4. ගාල්ල | (1) ගහබඩ පත්තුව | ඔක්තෝබර් 1 | මාර්තු 31 | පෙබරවාරි 15 | සැප්තැම්බර් 15 |
| 5. මාතර | (1) වැලිගම් කෝරළය | ජූලි 1 | පෙබරවාරි 28 | පෙබරවාරි 25 | සැප්තැම්බර් 15 |
| | (2) ගහබඩ පත්තුව | ජූනි 1 | මාර්තු 15 | මාර්තු 1 | සැප්තැම්බර් 15 |
| 6. හම්බන්තොට | (1) මාගම්පත්තුව | ඔක්තෝබර් 15 | අප්‍රියෙල් 15 | මාර්තු 20 | සැප්තැම්බර් 30 |
| | (2) නැගෙනහිර ගිරුවා පත්තුව | ඔක්තෝබර් 15 | අප්‍රියෙල් 15 | මාර්තු 20 | සැප්තැම්බර් 30 |
| | (3) උතුරු ගිරුවා පත්තුව | ජූලි 1 | මාර්තු 31 | මාර්තු 1 | සැප්තැම්බර් 30 |
| | (4) දකුණු ගිරුවා පත්තුව | ජූලි 1 | අප්‍රියෙල් 15 | මාර්තු 20 | සැප්තැම්බර් 30 |
| 7. යාපනය | (1) කරච්චි | සැප්තැම්බර් 25 | අප්‍රියෙල් 10 | අප්‍රියෙල් 15 | සැප්තැම්බර් 15 |
| 8. වවුනියා | (1) උතුරු වවුනියා | සැප්තැම්බර් 1 | අප්‍රියෙල් 30 | ජනවාරි 1 | අගෝස්තු 31 |
| | (2) දකුණුවවුනියා (දෙමළ කොට්ඨාශය) | සැප්තැම්බර් 1 | අප්‍රියෙල් 15 | ජනවාරි 1 | අගෝස්තු 31 |
| | (3) වෙන්ගලචෙට්ටිකුලම් | සැප්තැම්බර් 1 | අප්‍රියෙල් 15 | ජනවාරි 1 | අගෝස්තු 31 |
| 9. මඩකලපුව | (1) දකුණු මාන්මුනෙයි හා එරුවිල් පෝරතිවු | ඔක්තෝබර් 1 | අප්‍රියෙල් 15 | අප්‍රියෙල් 15 | සැප්තැම්බර් 15 |
| | (2) උතුරු මාන්මුනෙයි | ඔක්තෝබර් 1 | අප්‍රියෙල් 15 | අප්‍රියෙල් 15 | සැප්තැම්බර් 15 |
| | (3) බටහිර මාන්මුනෙයි—ගොවිකාරක සභා අංක 82 | ඔක්තෝබර් 1 | අප්‍රියෙල් 15 | — | — |
| | ගොවිකාරක සභා අංක 35 37, 43 සහ 67 | ඔක්තෝබර් 1 | අප්‍රියෙල් 15 | අප්‍රියෙල් 15 | සැප්තැම්බර් 15 |
| | (4) කෝරලේ පත්තුව | ඔක්තෝබර් 1 | මාර්තු 31 | පෙබරවාරි 15 | ජූනි 30 |
| 10. අම්පාරේ | (1) සමන්තුරේ පත්තුව | ඔක්තෝබර් 15 | මැයි 15 | මැයි 15 | නොවැම්බර් 15 |
| 11. ත්‍රිකුණාමලය | (1) කින්නියා | සැප්තැම්බර් 15 | මාර්තු 31 | මැයි 1 | අගෝස්තු 1 |
| | (2) කන්තලේ | සැප්තැම්බර් 15 | මාර්තු 31 | මැයි 1 | අගෝස්තු 1 |
| 12. කුරුණෑගල | (1) හිරියාල හත්පත්තුව | අගෝස්තු 15 | අප්‍රියෙල් 30 | මාර්තු 15 | සැප්තැම්බර් 30 |
| | (2) කටුගම්පොල හත්පත්තුව | ජූනි 15 | මාර්තු 31 | මාර්තු 15 | සැප්තැම්බර් 30 |
| | (3) කුලියාපිටිය | ජූනි 15 | මාර්තු 31 | මාර්තු 15 | සැප්තැම්බර් 30 |
| | (4) බිංගිරිය | ජූනි 15 | මාර්තු 31 | මාර්තු 15 | සැප්තැම්බර් 30 |
| | (5) දේවමැදිහත්පත්තුව | ජූලි 15 | අප්‍රියෙල් 15 | මාර්තු 15 | සැප්තැම්බර් 30 |
| 13. අනුරාධපුරය | (1) මධ්‍යම හුරුලුපලාත | නොවැම්බර් 30 | මැයි 1 | පෙබරවාරි 1 | සැප්තැම්බර් 30 |
| | (2) උතුරු හුරුලු පලාත | ඔක්තෝබර් 15 | මැයි 31 | පෙබරවාරි 1 | සැප්තැම්බර් 30 |
| | (3) උතුරු කලාගම් පලාත | ඔක්තෝබර් 15 | මැයි 15 | අප්‍රියෙල් 15 | සැප්තැම්බර් 30 |
| | (4) දකුණු කලාගම් පලාත | ඔක්තෝබර් 15 | මැයි 15 | අප්‍රියෙල් 15 | සැප්තැම්බර් 30 |
| | (5) බටහිර නුවරගම් පලාත | නොවැම්බර් 15 | අප්‍රියෙල් 30 | මැයි 15 | අගෝස්තු 30 |
| | (6) නැගෙනහිර නුවරගම් පලාත | ඔක්තෝබර් 15 | අප්‍රියෙල් 30 | මැයි 15 | සැප්තැම්බර් 30 |
| | (7) දකුණු නුවරගම් පලාත | ඔක්තෝබර් 15 | මැයි 15 | අප්‍රියෙල් 15 | නොවැම්බර් 15 |
| 14. බදුල්ල | (1) පස්සර | ඔක්තෝබර් 1 | අගෝස්තු 31 | අප්‍රියෙල් 1 | ජනවාරි 31 |
| | (2) යටිකිඳ | ඔක්තෝබර් 1 | ජූලි 31 | අප්‍රියෙල් 15 | පෙබරවාරි 15 |
| | (3) මැදකිඳ | ජනවාරි 10 | ජූලි 20 | ජූලි 1 | දෙසැම්බර් 10 |
| 15. රත්නපුර | (1) නවදුන් කෝරළය | අගෝස්තු 15 | අප්‍රියෙල් 30 | අප්‍රියෙල් 1 | සැප්තැම්බර් 30 |
| | (2) අටකලන් කෝරළය (පහත (3)හි දක්වා ඇති ගොවි කාරක සභා ප්‍රදේශ හැරයි) | ඔක්තෝබර් 1 | අප්‍රියෙල් 30 | අප්‍රියෙල් 1 | සැප්තැම්බර් 30 |
| | (3) අටකලන් කෝරළය—ගොවිකාරක සභා අංක 2, 12, 17 සහ 21 | ඔක්තෝබර් 1 | මැයි 31 | අප්‍රියෙල් 1 | නොවැම්බර් 30 |
| 16. කෑගල්ල | (1) දෙහිගම්පල් කෝරළය හා පහත බුලත්ගම | අගෝස්තු 1 | අප්‍රියෙල් 30 | අප්‍රියෙල් 1 | සැප්තැම්බර් 30 |
| | (2) බෙලිගල් කෝරළය | අගෝස්තු 1 | අප්‍රියෙල් 15 | මාර්තු 15 | අගෝස්තු 31 |

9–387/2

# "සුරාබදු ආඥාපනත" පිළිබඳ දැන්වීම්

එල් ඞී—16/37
සු. කො. : එල් ඒ. ජී/18

## සුරාබදු ආඥාපනත

### අංක 582 දරණ සුරාබදු නිවේදනය

(1970 සැප්තැම්බර් මස 30 වැනි දින සිට හා පසුව සෑම සුරාබදු බලපත්‍රයක්වම අදාල කොන්දේසි මාලාව)

(52 වැනි අධිකාරය වන) සුරාබදු ආඥාපනතේ 25 වෙනි වගන්තිය යටතේ මුදල් ඇමතිතුමා විසින්—

(1) මෙහි පහත සඳහන් උපලේඛනයෙහි දක්වා ඇති කොන්දේසි 1970 සැප්තැම්බර් මස 30 වෙනි දින සිට, තවදුරටත් දැනුම් දෙනතුරු, සෑම සුරාබදු බලපත්‍රයටම අදාල විය යුතු පොදු කොන්දේසි විය යුතුයයි ද,

(2) 1969 සැප්තැම්බර් මස 19 වැනි දින හා අංක 14,872 දරණ ගැසට් පත්‍රයෙහි පළවූ අංක 577 දරන සුරාබදු නිවේදනය 1970 සැප්තැම්බර් මස 30 වැනි දින සිට අවලංගු කළයුතු යයිද නියම කරනු ලැබූ බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

එම්. රාජේන්ද්‍ර,
මුදල් අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 සැප්තැම්බර් 1 වැනි දින,
කොළඹ දී ය.

## උපලේඛනය

**1. තැබෑරුම් ගොඩනැගිලි පිළිබඳ කොන්දේසි : ගොඩනැගිල්ලක් කඩා වෙනස් කිරීම සඳහා ආණ්ඩුවේ දිසාපතිගේ අනුමතිය ලබා ගැනීම :—**

(1) තැබෑරුම්වලදී (මෙරට මත්පැන් හෝ විදේශීය මත්පැන්) විකිණිය යුත්තේ සුදුසු ගොඩනැගිල්ලක තබාගෙනය. ඒ මුළු ගොඩනැගිල්ලම හෝ එහි කොටසක් හෝ තැබෑරුමක් වශයෙන් පාවිච්චි කිරීම සඳහා වෙනමම වෙන් කොට තැබිය යුතුය. තැබෑරුමක් ඊට යාව පිහිටි (මිනිසුන් පදිංචි) ගෙයකුත් අතර දොර ජනෙල් ආදි මොකක්වත් තිබෙනවා නම් ඒවා සෑම විටම වසා තැබිය යුතුය. කිසිම තැබෑරුමකට ඇතුළුවීමට හෝ ඉන් පිටවීමට ඉදිරිපස දොර හැර අන් කිසි දොරක් නොතිබිය යුතුය. තැබෑරුම ඇතුළේ දිවා රෑ දෙකේදීම සෑහෙන තරම් එළිය තිබිය යුතුය. රේන්දකරු විසින් හෝ මුරකරුවකු මෙන් කටයුතු කරන බලයලත් සේවකයකු විසින් හැර අන් කවරකු විසින් වත් තැබෑරුම පදිංචි ස්ථානයක් වශයෙන් පාවිච්චි නොකළ යුතුය. තැබෑරුමේ බිත්ති පොල් අතුවලින් සදා නොතිබිය යුතුය.

(2) ආණ්ඩුවේ දිසාපතිගේ අනුමැතිය නැතිව තැබෑරුම් ගොඩනැගිල්ලකට කිසිම වෙනසක් කිරීම හෝ අමුතු වෙන් කාල්ලක් ගැනීම හෝ කිසිම තාප්පයක් හෝ වැටක් හෝ වෙනයම් කොටුවක් බැඳීම හෝ නොකොට යුතුය.

(3) යම්කිසි තැබෑරුමක පෞද්ගලික ආපාන පිසීකාවක් (බාර් එකක්) පිහිටුවීම සඳහා නොමිලයේ දෙන විශේෂ බලපත්‍රයකින් තමාගේ කල්පනාවේ හැටියට අවසර දීමට ආණ්ඩුවේ දිසාපතිට බලය තිබේ. එසේ බලය දිය හැක්කේ ඒ ආපාන පිසීකාවේ ඇති ලී බඩු හා උපකරණද තැබෑරුම පිහිටා තිබෙන ප්‍රදේශයද ඊට සෑහේ යයි ඔහුට හැඟුනොත් පමණකි.

එහෙත් ඒ ආපාන පිසීකාවට ඇතුළු වන දොරටුව ළඟ සිට බලන විට ඒ ආපාන පිසීකාව සම්පූර්ණ වශයෙන් පෙනියන පරිදි තිබිය යුතුවා පමණක් නොව ඒ ආපාන පිසීකාවට ඇතුළුවීම ප්‍රධාන දොරටුවෙන්ම හෝ ඒ ආපාන පිසීකාවේ ස්වභාවය පැහැදිලිව දක්වන සංඥා පුවරුවක් සවිකොට හෝ ගසා ඇති වෙනම දොරක් වීම ද අවශ්‍යය.

**2. බලපත්‍ර ලත් ස්ථානවල සංඥා පුවරු ඇසීම.**—බලපත්‍ර ලත් ඉස්කාගාර, සෙසු මත්පැන් වර්ගයක් සාදන ස්ථාන, මත්පැන් පෙරන ස්ථාන, තොග සුරා ගබඩාවල්, අරක්කු රේන්දකරුවන්ගේ සුරා ගබඩාවල්, සුරා බෝතල් වලට අසුරන ගුදම්, මෙරට බෙහෙත් ඉස්පිරිතු හෝ පළතුරුවලින් පෙරන මත්පැන් හෝ පොල්වලින් පෙරන මත්පැන් විකිණීමට බලපත්‍ර ලත් ස්ථාන, රටබීම සාප්පු, බෙහෙත් වයින් සාප්පු, පරිපාක ඉස්පිරිතු සාප්පු, ආපනශාලා කෑන්ටීම් (බීර හා පෝටර පමණක් විකිණීම සඳහා බලපත්‍ර ලත් ස්ථානද ඇතුළු) තැබෑරුම් යන මේ කොයි එකක වුවත් ඉදිරියෙහි බලපත්‍රයේ අංකය හා ස්වභාවයත්, බලපත්‍රලාභියාගේ නමත්, මෙරට බීම කැන්ටීම හෝ තැබෑරුම් සම්බන්ධයෙන් වූ විට නම් විකුණන මිළ ගණනද සඳහන් සංඥා පුවරුවක් සවි කළ යුතුය. මේ තොරතුරු කාටත් කියවිය හැකි පරිදි පැහැදිලි ලෙස සිංහලෙන් හා දෙමළෙන් පින්තාරු කර තැබිය යුතුය. බලපත්‍රයක් සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන භාෂාත්‍රයෙන්ම මුද්‍රිත මේ කොන්දේසි මාලාවේ පිටපතක් බලපත්‍ර ලත් සෑම ස්ථානයක්ම ඇතුළත කාටත් පෙනෙන පරිදි ප්‍රදර්ශනය කළ යුතුය.

**3. (1) බලපත්‍ර ලත් මත්පැන් වර්ගය හැර වෙන මත්පැන් වර්ගයක් ළඟ තබාගැනීමේ තහනම.**—බලපත්‍රයේ සඳහන් වන මත්පැන් වර්ගය හැර වෙන යම් මත්පැන් වර්ගයක් හෝ මද්‍ය ඖෂධයක් හෝ මත්පැන් වර්ණවත් කිරීමට හෝ රසවත් කිරීමට පාවිච්චි කරනු ලබන හෝ පාවිච්චි කළ හැකි යම් සාරයක් හෝ ද්‍රව්‍යයක් වූ කලී සුරාබදු කොමසාරිස් විසින් දෙන ලද විශේෂ බලපත්‍රයක් යටතේ මිස නැත්නම් බලපත්‍ර ලත් මොනම ස්ථානයකවත් තබා ගැනීම තහනම්ය. එහෙත් මත්පැන් වර්ණවත් කිරීමට හෝ රසවත් කිරීමට කල්දේරම් මඩුවල තබාගන්නාවූ හෝ පාවිච්චි කරන්නාවූද ශරීරයට අහිතවත් නොවන්නාවූද ද්‍රව්‍ය සුරාබදු කොමසාරිස් විසින් අනුමත කරන ලද්දේ නම් ඒ ද්‍රව්‍ය සම්බන්ධයෙන් මේ කොන්දේසියේ පූර්වෝක්ත විධිවිධාන අදාළ නොවිය යුතුය.

**(2) මත්පැන් බාලකර විකිණීමේ තහනම.**—(අ) බලපත්‍ර ලත් ස්ථානවල, බලය ලත් ගබඩාවල, ගුදම් හා එකතු කිරීමේ ස්ථානවල විකුණනු ලබන හෝ විකිණීමට තබා ඇති සියළු මත්පැන් වර්ග හා මද්‍ය ඖෂධ වර්ග හොඳ විය යුතුය. කලවම් නැති විය යුතුය. යම්කිසි මත්පැනක මද්‍ය බලය වැඩි කිරීමටත් වෙනයම් කරුණක් සඳහාවත් ඊට කිසිවක් මිශ්‍ර නොකළ යුතුය.

එහෙත් මත්පැන් වර්ණවත් කිරීමට හෝ රසවත් කිරීමට ඉස්කාගාරයන්හි තබාගනු ලබන හෝ පාවිච්චි කරනු ලබන හා ශරීරයට අහිතවත් නොවන ද්‍රව්‍ය සුරාබදු කොමසාරිස් විසින් අනුමත කරන ලද්දේ නම් ඒ ද්‍රව්‍ය සම්බන්ධයෙන් මේ කොන්දේසියේ පූර්වෝක්ත විධිවිධාන අදාළ නොවිය යුතුය.

(ආ) යම් මත්පැනක් බාල කරන ලද බවට හොඳ තත්ත්වයේ මත්පැනක් නොවන බවට හෝ ආණ්ඩුවේ රස පරීක්ෂක අත්සන් කර ඇති වාර්තාවක් මේ කොන්දේසියේ කාර්යයන් සඳහා තීරණාත්මක සාධක වශයෙන් පිළිගනු ලැබිය යුතුය.

**(3) මත්පැන් විකුණන මිළ.**—සංඥා පුවරුවෙහි සඳහන් වන මිළ ගණනට වඩා වැඩි මිලකට කිසිම මත්පැනක් මෙරට මත්පැන් කැන්ටීම්වල හෝ තැබෑරුම්වල හෝ විකිණිය යුතු නොවේ. ඒ ඒ දවසේ කැන්ටීම හෝ තැබෑරුම විවෘත කරන වේලාවට කලින් "අද මත්පැන්වල මිළ මෙපමණය" කියා නියම කරගත යුතුවාක් හැර එකී මිළ ඒ දවස ඇතුළතදී වෙනස් නොකළ යුතු ද වන්නේ ය.

**4. සේවකයන් පිළිබඳ අනුමැතිය.**—මත්පැන් නිපදවීමේ, බෝතල් ගතකිරීමේ, ප්‍රවාහනය කිරීමේ හෝ විකිණීමේ, ගුදම්, ගබඩා, තැබෑරුම්, වතුවල තිබෙන අරක්කු කැන්ටීන්, වතුවල තිබෙන රා කැන්ටීන්, විනාකිරි ගබඩා, රා අතුරු, රා එකතු කරන ස්ථාන, ආපනශාලා, ක්ලබ්කාර්ස් තබාගැනීමට අවසර ඇති වෙනත් විදේශීය මත්පැන් ශාලා සහ හෝටල්, රා බෝතල් ගත කරන කර්මාන්ත ශාලා, රටබීම, බෝතල් කිරීම පිණිස බලපත්‍ර ලත් ස්ථාන, පදම් කළ අරක්කු නිපදවීමේ බලපත්‍ර ලත් ස්ථාන හා ගස්බදු ක්‍රමය බල පවත්වන ඕනෑම ප්‍රදේශයක යන මේවායේ සේවයට ගැනීමට අදහස් කරන සියළු දෙනාගේ නම් හා ලිපිනයන් සුරාබදු අධිකාරී වෙත ලියා යැවිය යුතුය. එවිට ඔවුන් අතුරෙන් තමා අනුමත කරන අය සේවයට ගැනීමට බලය දී අවසර පත්‍රයක් ඔහු විසින් එවනු ලැබේ. ඒ අවසර පත්‍රය ඒ අය සේවය කරන බලපත්‍ර ලත් ස්ථානයේ ප්‍රදර්ශනය කර තැබිය යුතුය.

තැබෑරුමක් සම්බන්ධයෙන් වූ විට, බලපත්‍ර ලාභියා විසින් එවකට වලංගුව පවත්නා අවසර පත්‍රය, යම් තාවකාලික සේවකයකුගේ නම, ලිපිනය සහ ඒ සේවකයා සේවයෙහි යොදවනු ලැබීම ආරම්භ වීමේ දිනය එහි පිටසන් කොට, බලපත්‍රලාභියා විසින් විධිමත් ලෙස අත්සන් තබා දින යොදා සුරාබදු අධිකාරී වෙත සපයා ඇතහොත් සුරාබදු අධිකාරී විසින් අනුමත කරනු ලැබූ සේවකයෙකු වෙනුවෙන් වූ තාව තාවකාලික සේවකයකු වශයෙන්, 15 දිනකට නොවැඩි කාල සීමාවක් තුළ ඒ තැනැත්තා සේවයෙහි යෙදවිය හැකිය. යම් හෙයකින් ඒ තාවකාලික සේවකයා බඳවා ගනු ලැබීම සුරාබදු අධිකාරී විසින් අනුමත කරනු නොලැබුව හොත්, ඔහුගේ සේවය බලපත්‍රලාභියා විසින් වහාම අත්හිටවිය යුතුය.

ලංකාවේ රටවැසියකු නොවන යම් තැනැත්තකු සේවයෙහි යෙදවීමට මුදල් අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් විසින් බලය දෙනු ලැබූ විටක හැර, ලංකාවේ රටවැසියකු වෙත පමණක් ඒ අවසර පත්‍රය නිකුත් කළ යුතුය. ලංකාවේ රටවැසියකු නොවන තැනැත්තකු තාවකාලික සේවකයකු ලෙස මෙහි ඉහත විධිවිධාන සලසා ඇති පරිදි සේවයෙහි නොයෙදවිය යුතුය. එසේ බලය පවරනු ලැබූ යම් තැනැත්තකු හෝ තාවකාලික සේවකයකු නිසි පරිදි හැඳි පිරිසිදු ඇඳුමෙන් සැරසී සිටිය යුතුය. බලය පවරනු ලැබූ තැනැත්තකු හෝ තාවකාලික සේවකයකු නොවන තැනැත්තකු කිසිම බලපත්‍ර ලත් ස්ථානයක සේවයේ නොයෙදවිය යුතුය. මේ කොන්දේසි යටතේ නිකුත් කරන ලද යම් අවසර පත්‍රයක් සුරාබදු අධිකාරී විසින් ඕනෑම වේලාවකදී අවලංගු කරනු ලැබිය හැකි විය යුතුය.

5. **සේවයට බඳවාගත නොහැකි අය.**—පහත සඳහන් අය විසින් මත්පැන් හෝ මද්‍ය ඖෂධ වර්ග සෑදීම හෝ එකතු කිරීම හෝ විකිණීම හෝ ගෙනයාම තහනම්ය. එසේම ඔවුන් ඒවා සෑදීම, එකතු කිරීම, විකිණීම හෝ ගෙනයාම සඳහා සේවයට ගැනීමද තහනම්ය :—

(i) ලාදුරු රෝගයෙන් හෝ යම්කිසි වසංගත රෝගයකින් හෝ ස්පර්ශයෙන් බෝවෙන රෝගයකින් පෙළෙන අය ;

(ii) සුරාබදු බලපත්‍ර දරීම හෝ සුරාබදු බලපත්‍රධාරීන් යටතේ සේවය කිරීම හෝ තහනම් කරනු ලැබුවන්ගේ ලැයිස්තුවට නම් ඇතුලත් වී ඇති අය ;

(iii) මීට ඉහත අවුරුදු දෙක තුල සුරාබදු පිළිබඳ ඕනෑම වරදකට වරදකරුවන් වූ අය හෝ තුන් වතාවකට වැඩියෙන් සුරාබදු වරදවලට වරදකරුවන් වූ අය ;

(iv) (22 වැනි අධිකාරය වන) අපරාධ වැළැක්වීමේ ආඥාපනතෙහි අර්ථය ඇතුලත අපරාධකරුවන් වන අය ;

(v) වයස අවුරුදු දහ අටට අඩු පිරිමි හා කොයි වයස වුවත් ගැහැණු.

6. **විවෘත කිරීමේ සහ වැසීමේ වේලාවල් : (1) රා තැබෑරුම්.**—රා තැබෑරුම් පෙරවරු 8 පටන් පස්වරු 6.30 වන තෙක් විවෘතව තැබිය යුතුය. සෙසු සියලු වේලාවලදී වසා තැබිය යුතුය. එසේ වුවද ආණ්ඩුවේ දිසාපතිට සුරාබදු උපදේශක සභාවේ අදහස් විමසීමෙන් පසු සාමාන්‍යයෙන් යම්කිසි ප්‍රදේශයක පිහිටි සියලු තැබෑරුම් හෝ යම්කිසි ප්‍රදේශයක පිහිටි විශේෂ තැබෑරුමක්—

(අ) නියමිත වේලාවට වඩා ප්‍රමාද වී විවෘත කිරීමට නියම කිරීමට ; හා

(ආ) නියමිත වේලාවට කලින් වැසීමට නියම කිරීමට ; හා

(ඇ) විවෘත කරන වේලාව හා වසන වේලාව අතර මේ කාල පරිච්ඡේදය තුල හෝ මේ මේ කාල පරිච්ඡේදයන් තුල තැබෑරුම් වසා තැබිය යුතු යයි නියම කිරීමට ; හා

(ඈ) ප්‍රාදේශීය තත්ත්වයන් හේතුකොටගෙන නගරයක් ඇතුලත හෝ ඉන් පිටත සහ විශේෂ අවස්ථාවන්හිදී නගරයකින් පිටත, (පෙරවරු 7 ට කලින් නොවිය යුතු) කලින් විවෘත කරන වේලාවෙන් හා (ඒ ප්‍රදේශයෙහි අරක්කු තැබෑරුම් වසන වේලාවෙන් පසුව නොවිය යුතු) ප්‍රමාද වී වසන වේලාවක්ද නියම කිරීමට ; හා

(ඉ) පෝය දවස්වලදී හෝ ආගමික ප්‍රතිපත්ති පූරණ වෙනත් නියමිත දිනවලදී මුළු දවස හෝ පැය ගණනකින් යුත් නියමිත කාල පරිච්ඡේදයක් හෝ කාල පරිච්ඡේදයන් තුල බලපත්‍රලාභියාගේ ඉල්ලීම පිට තැබෑරුම වසා තැබීමට අවසර දීමට හෝ එබඳු ඉල්ලීමක් නැතිව තැබෑරුම වසා තැබීමට කෙලින්ම නියම කිරීමටත් ;

බලය ඇත්තේය. රා තැබෑරුමක් විවෘත කොට තැබිය හැකි වේලාව බලපත්‍රයෙහි සඳහන් කල යුතුය. ඒ වේලාවේදී මිස අන්කිසි වේලාවකදී රා විකිණිය යුතු නොවේ.

(2) **අරක්කු තැබෑරුම්.**—අරක්කු තැබෑරුම් පෙරවරු 8 පටන් පස්වරු 6.30 තෙක් විවෘත කොට තැබිය යුතුය. සෙසු සියලු වේලාවලදී වසා තැබිය යුතුය. එසේ වුවද ආණ්ඩුවේ දිසාපතිට සුරාබදු උපදේශක සභාවේ අදහස් විමසීමෙන් පසු සාමාන්‍යයෙන් යම්කිසි ප්‍රදේශයක පිහිටි සියලු තැබෑරුම් හෝ යම්කිසි ප්‍රදේශයක පිහිටි තැබෑරුමක්—

(අ) නියමිත වේලාවට වඩා ප්‍රමාද වී විවෘත කිරීමට නියම කිරීමට ; හා

(ආ) නියමිත වේලාවට කලින් වැසීමට නියම කිරීමට ; හා

(ඇ) විවෘත කරන වේලාව හා වසන වේලාව අතර මේ කාල පරිච්ඡේදය හෝ මේ මේ කාල පරිච්ඡේදයන් තුල තැබෑරුම් වසා තැබිය යුතු යයි නියම කිරීමට ; හා

(ඈ) ප්‍රාදේශීය තත්ත්වයන් හේතුකොටගෙන නගරයක් ඇතුලත හෝ ඉන් පිටත සහ විශේෂ අවස්ථාවන්හිදී නගරයකින් පිටත (කිසිම අවස්ථාවකදී පස්වරු 9 ට පසුව නොවිය යුතු) ප්‍රමාද වී වසන වේලාවක් නියම කිරීමට ; හා

(ඉ) පෝය දවස්වල දී හෝ ආගමික ප්‍රතිපත්ති පූරණ වෙනත් නියමිත දිනවලදී මුළු දවස හෝ පැය ගණනකින් යුත් නියමිත කාල පරිච්ඡේදයක් හෝ කාල පරිච්ඡේදයන් තුල බලපත්‍රලාභියාගේ ඉල්ලීම පිට තැබෑරුම වසා තැබීමට අවසර දීමට හෝ එබඳු ඉල්ලීමක් නැතිව තැබෑරුම වසා තැබීමට කෙලින්ම නියම කිරීමටත් ;

බලය ඇත්තේය. අරක්කු තැබෑරුමක් විවෘත කොට තැබිය හැකි වේලාව බලපත්‍රයෙහි සඳහන් කල යුතුය. ඒ වේලාවේදී මිස අන් කිසි වේලාවකදී අරක්කු විකිණිය යුතු නොවේ.

(3) **විදේශීය මත්පැන් විකුණන ස්ථාන.**—විදේශීය මත්පැන් විකිණීමට බලය ලත් ස්ථාන, ආණ්ඩුවේ දිසාපති විසින් බලපත්‍රයෙහි සඳහන් කොට ඇති විවෘත කරන වේලාවත් වසන වේලාවත් අතර කාලය තුලදී විවෘත කොට තැබිය යුතුය. සෙසු සියලු වේලාවලදීම වසා තැබිය යුතුය.

එසේ වුවද, 1931 අප්‍රේල් මස 17 වැනි දින අංක 7,845 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළවූ 218 වැනි සුරාබදු නිවේදනයෙන් විවෘත කරන හා වසන වේලාවන් නියම කොට ඇත්තාවූ ස්ථානයන් සම්බන්ධයෙන් ඒ නියම කරන ලද වේලාවල් අදාළ වේ ; (බීර හා පෝටර පමණක් විකිණීමට බලපත්‍ර ලත් ස්ථානද ඇතුළු) විදේශීය මත්පැන් තැබෑරුම් වසන වේලාව ඒ ප්‍රදේශයෙහි පිහිටි අරක්කු තැබෑරුම වසන වේලාවට වඩා ප්‍රමාද නොවිය යුතුය. තවද ආණ්ඩුවේ දිසාපතිට සුරාබදු උපදේශක සභාවේ අදහස් විමසීමෙන් පසු සාමාන්‍යයෙන් යම්කිසි ප්‍රදේශයක පිහිටි (බීම විකුණන) සියලු ස්ථානයන් හෝ යම්කිසි ප්‍රදේශයක පිහිටි (බීම විකුණන) විශේෂ ස්ථානයක්—

(අ) විවෘත කරන වේලාව වසන වේලාව අතර මේ කාල පරිච්ඡේදය තුල හෝ මේ මේ කාල පරිච්ඡේදයන් තුල වසා තැබිය යුතු යයි නියම කිරීමට ;

(ඉ) පෝය දවස්වලදී හෝ ආගමික ප්‍රතිපත්ති පූරණ වෙනත් නියමිත දිනවලදී මුළු දවසම හෝ පැය ගණනකින් යුක්ත නියමිත කාල පරිච්ඡේදයන් හෝ කාල පරිච්ඡේදයන් තුල බලපත්‍රලාභියාගේ ඉල්ලීම පිට ඒ ස්ථානය වසා තැබීමට අවසර දීමට හෝ එබඳු ඉල්ලීමක් නැතිව ඒ ස්ථානය වසා තැබීමට කෙළින්ම නියම කිරීමට ;

බලය ඇත්තේය. තවද යම්කිසි විශේෂ අවස්ථාවකදී ආණ්ඩුවේ දිසාපතිට ස්වකීය අභිමතය පරිදි තැබෑරුම් හෝ බීර හා පෝටර පමණක් විකිණීමට බලපත්‍ර ලත් ස්ථානයන් හැර ඕනෑම බලපත්‍ර ලත් ස්ථානයක් නියමිත වේලාවෙන් පසු තමා නියම කරන යම් වේලාවක් වන තෙක් විවෘත කොට තැබීමට හෝ බලපත්‍රලාභියාගේ ඉල්ලීම පිට දවස් 7ට වැඩි නොවන කාල පරිච්ඡේදයක් තුල තාවකාලික වශයෙන් වසා තැබීමට හෝ ඉඩදීමට බලය ඇත්තේය.

විදේශීය මත්පැන් විකිණීම සඳහා බලපත්‍රයක් ලත් ස්ථානයක් විවෘත කොට තැබිය හැකි වේලාව බලපත්‍රයෙහි සඳහන් කල යුතුය. ඒ වේලාවේදී හැර අන්කිසි වේලාවකදී විදේශීය මත්පැන් එහිදී විකිණිය යුතු නොවේ.

තැබෑරුමක් හෝ බීර සහ පෝටර් පමණක් විකිණීම සඳහා බලපත්‍ර ලත් ස්ථානයක් නොවන, විදේශීය මත්පැන් විකිණීම සඳහා බලපත්‍ර ලත් යම් ස්ථානයකදී වෙනත් ව්‍යාපාරික ගනුදෙනු කරනු ලබන අවස්ථාවක, මත්පැන් විකිණීම සඳහා වූ බලපත්‍රයේ නියමිත කාල සීමාවන්ට අයත් නොවන වේලාවන්හි, එ වෙනත් ව්‍යාපාරික ගනුදෙනු කිරීමේ කාර්‍යය සඳහා පමණක් එම ස්ථාන විවෘත කර තැබිය හැකිය.

7. **වෙරිවීම, කලකෝලාහල කිරීම, සූදු කෙලීම.**—බලපත්‍ර ලත් කිසිම ස්ථානයක කිසිවකුට වෙරිවී සිටීමට හෝ කලකෝලාහල කිරීමට හෝ සූදු කෙලීමට හෝ ඉඩ නොදිය යුතුය. මත්පැන් විකිණීමට බලපත්‍රයක් ලත් සෑම පුද්ගලයකුම හා බලපත්‍රයක් ලත් ස්ථානයක් භාරව සිටින සෑම පුද්ගලයකුම විසින් වෙරිවූ හෝ රෞද්‍ර ස්වභාවයට පත්වූ හෝ කලකෝලාහල කරන හෝ නොහික්මුණු ලෙස හැසිරෙන කිසිවකුත් බලපත්‍ර ලත් ස්ථානයට පැමිණීමෙන් එවකට වලංගු වන යම් ආඥාපනතක් යටතේ දඩුවමකට භාජන වන කිසිවකුත් ඒ ස්ථානයට ඇතුළු නොගත යුතුවා පමණක් නොව, ඒ ස්ථානයෙන් බැහැරට යැවිය යුතුවාත් හැර එබඳු කිසිවකුට කිසිම මත්පැනක් විකිණීමද නොකල යුතුය.

8. **කිසිම වේලාවකදීවත් ඇතුළු නොගත යුතු අය.**—මං පහරන්නන් නොහොත් හොරුන්, පෙරලි කරන්නන් නොහොත් කැරළි ගසන්නන්, වෛශ්‍යාවන් වශයෙන් අපකීර්තියට පත් ස්ත්‍රීන් (22 වැනි අධිකාරයෙන්) අපරාධ වැළැක්වීමේ ආඥාපනතෙන් අදහස් කරන පරිදි ලියාපදිංචි කල අපරාධකාරයන් යන මොවුන්ගෙන් කවරකුවත් බලපත්‍රයක් ලත් කිසිම ස්ථානයකට ඇතුළු නොගත යුතුය. බලපත්‍රයක් ලත් මොනම ස්ථානයකවත් එබඳු අයකු ගැවසුන හොත් ඒ බව කිට්ටුවෙන්ම සිටින මහේස්ත්‍රාත්වරයාට හෝ පොලිස් නිලධාරියාට දැන්වීම බලපත්‍රලාභියාගේ යුතුකම විය යුතුය.

9. **බලපත්‍රයක් ලත් ස්ථානයක් වැසීමෙන් පසු එයට කිසිවෙකු ඇතුළු නොගත යුතු බව.**—බලපත්‍රයක් ලත් යම්කිසි ස්ථානයක් වැසීමෙන් පසු නැවත ඒ ස්ථානය විවෘත කරන තුරු හෝ ඒ ස්ථානය වසා තබන මොනම කාල පරිච්ඡේදයක් අතරතුර හෝ කිසිවකු ඒ ස්ථානයට ඇතුළු නොගත යුතුය. තවද රාජකාරියෙහි යෙදී සිටින අතර කිසිම පොලිස් භටයකු (කොස්තාපල් කෙනෙකු) ඒ ස්ථානයට ඇතුළු නොගත යුතුය.

10. (1) තැබෑරුම් හා සෙසු බලපත්‍ර ලත් ස්ථාන වෙසක් උත්සවය සඳහා වැසීම.—පහත සඳහන් යම්කිසි බලපත්‍රයක් දරන හැම අයකු විසින් ඒ බලපත්‍රය ලත් ස්ථානය වෙසක් මාසයේ පුර පසලොස්වක් ද වැසිය යුතුය. එසේම ඒ දවසේදී ස්ථානය වැසීම හේතුකොටගෙන ඇතිවන යම්කිසි පාඩුවක් හෝ අලාභයක් වෙනුවෙන් වන්දි ඉල්ලීමට ඔහුට අයිතිවාසිකමක් නොතිබිය යුතුවා පමණක් නොව, ඔහු විසින් එසේ වන්දි ඉල්ලීමක් නොකළ යුතුය :—

(අ) ස්ථානයෙන් පිටතට ගෙන ගොස් පාවිච්චි කිරීම සඳහා සිල්ලර විදේශීය මත්පැන් විකිණීම සඳහා දෙන බලපත්‍ර;

(ආ) විදේශීය මත්පැන් තැබෑරුමක් සඳහා දෙන බලපත්‍ර;

(ඇ) අරක්කු තැබෑරුමක් සඳහා දෙන බලපත්‍ර;

(ඈ) රා තැබෑරුමක් සඳහා දෙන බලපත්‍ර;

(ඉ) බීර, ඒල්, ස්ටවුට්, පෝටර් යන මේ බීම විකිණීම සඳහා දෙන බලපත්‍ර;

(ඊ) මෙරට සාදන බීර, ඒල්, ස්ටවුට්, පෝටර් යන මේ බීම විකිණීම සඳහා දෙන බලපත්‍ර;

(උ) ආපන ශාලාවක හෝ රෙස්ටෝරන්ට් ශාලාවක මත්පැන් විකිණීම සඳහා දෙන බලපත්‍ර;

(ඌ) හෝටලයක ආපන පිහිටාවක් තබාගැනීම සඳහා දෙන බලපත්‍ර;

(එ) (මෙරට සාදන ධාන්‍ය මත්පැන් ද ඇතුළුව) විදේශීය මත්පැන් විකිණීම සඳහා යම් යම් උත්සව අවස්ථාවන්හිදී දෙන බලපත්‍ර;

(ඒ) හෝටලයක හෝ නේවාසිකාගාරයක හෝ නේවාසිකයන්ට මත්පැන් සැපයීම සඳහා දෙන බලපත්‍ර;

(ඔ) ප්‍රසිද්ධ විනෝද ස්ථානයක් පිළිබඳව මත්පැන් විකිණීම සඳහා නිකුත් කරණ ලද බලපත්‍ර;

(ඕ) නානායමක් ඇතුළත මත්පැන් විකිණීම සඳහා දෙන බලපත්‍ර;

(ක) අරක්කු විකිණීම සඳහා දෙන වතු කැන්ටීම් බලපත්‍ර; සහ

(ග) රා විකිණීම සඳහා දෙන වතු කැන්ටීම් බලපත්‍ර;

(ච) විදේශීය මත්පැන් විකිණීම සඳහා පහත සඳහන් ස්ථාන යන් සම්බන්ධයෙන් නිකුත් කරන ලද විශේෂ බලපත්‍රය—

1. කොළඹ පිහිටි නාවියන්ගේ දූත මෙහෙය,
2. කොළඹ, උත්තර මන්ත්‍රණ සභාවේ ආපනශාලාව,
3. කොළඹ, බ්‍රිතාන්‍ය සේවා හා නාවික ආයතනය,
4. කටුනායක ගුවන් තොටුපළේ භෝජනාලය,
5. රත්මලාන ගුවන් තොටුපළේ භෝජනාලය,
6. දුම්රිය ආපනශාලා හා දුම්රියපොළ ආපනශාලා,
7. (බීර හා පෝටර් බලපත්‍රය) කොළඹ, 5 වැනි හරස් වීදියේ අංක 113,
8. (බීර හා පෝටර් බලපත්‍රය) කොළඹ, මැලිබන් වීදියේ අංක 78.

එසේවුද වුවත් මත්පැන් විකිණීමට අතිරේක වශයෙන් යම්කිසි බලපත්‍ර ලත් ස්ථානයක වෙන යම් ව්‍යාපාරයක් කරගෙන යනු ලැබේ නම්, එම ස්ථාන එකී ව්‍යාපාරය සඳහා විවෘතව තබා ගත හැකිය. එහෙත් එදින මත්පැන් විකිණීම හෝ මත්පැන් විකිණීම පිණිස ඉදිරිපත් කිරීම හෝ නොකට යුතුය.

(2) විශේෂ හේතූන් නිසා තැබෑරුම් හා සෙසු බලපත්‍ර ලත් ස්ථාන වැසීම.—නාවිකයන්ගේ හෝ හමුදාවන්ගේ රෙජිමේන්තුවක්, හෝ හමුදාවක් සමීපයෙහි කඳවුරු බැඳ සිටින විට හෝ ගමන් කරන විට ඒ ගමන් මාර්ගයෙහි හෝ ඒ සමීපයෙහි පිහිටි තැබෑරුම් ආණ්ඩුවේ දිසාපති නියම කළහොත් වැසිය යුතුය. එසේ ම ආගමික උත්සව සහ විශේෂ ආගමික චාරිත්‍ර විධි පැවැත්වීම්වලදී හෝ ආගමික කටයුතු පිළිබඳ කලබලයක් පවත්නාවිට හෝ ඡන්ද විමසීමක් පවත්වන දිනවලදී හෝ අරගලයක් ඇති වී තිබෙන විට හෝ අරගල යක් ඇති වෙතැයි සැකයක් පහළ වී තිබෙන විට, ආණ්ඩුවේ දිසාපති නියම කළොත් බලපත්‍රලත් ඕනෑම ස්ථානයක් තාවකාලිකව වැසිය යුතුය.

සමීපයෙහි කැරලි කෝලාහලයක් හෝ අරගලයක් පවතින විට සුරාබදු බලපත්‍රධාරී කවරෙකු විසින් වුවත් සිය කැමැත්තෙන්ම තමාගේ (බලපත්‍රලත්) ස්ථානය වැසිය යුතුය. එසේ වැසීම නිසා ඇතිවන කිසිම හානියක් හෝ අලාභයක් වෙනුවෙන් වන්දි ඉල්ලීමට බලපත්‍රලාභියාට හිමිකමක් නොතිබිය යුතුවාත් පමණක් නොව ඔහු විසින් වන්දි ඉල්ලීමක් ද නොකළ යුතුය.

11. මත්පැන් නොවිකිණිය යුත්තේ නොහොත් නොදිය යුත්තේ කෙබඳු අයටද යන වග.—කිසිම මත්පැන් වර්ගයක්—

(අ) (1) ලංකා යුද්ධ හමුදාව සම්බන්ධයෙන් නම් එයි යුද්ධ හමුදාපති විසින් ද;

(2) ලංකා රාජකීය නාවික හමුදාව සම්බන්ධයෙන් නම් නාවික හමුදාපති විසින් ද;

(3) ලංකා ගුවන් හමුදාව සම්බන්ධයෙන් නම් ගුවන් හමුදාපති විසින් ද;

(4) යම්කිසි ආගන්තුක හමුදාවක් සම්බන්ධයෙන් නම් එහි අණදෙන නිලධාරියා විසින් ද;

සීමා බැඳුමෙන් පිටස්තර වෙතැයි ලියවිල්ලකින් නම් කරන ලද බලපත්‍ර ලත් ස්ථානවලදී ලංකා යුද්ධ හමුදාවේ හෝ ලංකා රාජකීය නාවික හමුදාවේ හෝ ලංකා ගගන හමුදාවේ හෝ (360 වැනි අධිකාරය වන) ආගන්තුක හමුදාවන් පිළිබඳ පනත යටතේ මෙරටට පැමිණ සිටින ආගන්තුක හමුදාවක කිසිම භටයකුට හෝ

(ආ) රාජකාරියෙහි යෙදී සිටින විට—

(1) පොලිස් හමුදාවේ කිසිවකුට හෝ සුරාබදු දෙපාර්ත මේන්තුවේ නිලධරයකුට; හෝ

(2) දුම්රිය දෙපාර්තමේන්තුවේ සේවකයකුට; හෝ

(ඇ) තැබෑරුමක් ඇතුළතදී කිසිම ස්ත්‍රියකට; හෝ

(ඈ) මොනම අවස්ථාවකදීවත්—

(1) වයස අවුරුදු විසිඑකට අඩු අයකුට; හෝ

(2) සිහිවිකල වූ අයකුට; හෝ

(3) මත්වී සිටින බැව් පෙනෙන හෝ මත්වී සිටිතැයි විශ්වාස කළ හැකි කෙනෙකුට; හෝ

විකිණීම හෝ දීම නොකට යුතුය.

12. බලපත්‍ර වෙන කෙනෙකුට පැවරිය නොහැකි බව, කළමනා කරුගේ පත්වීම අනුමත කළයුතු බව.—(අ) ආණ්ඩුවේ දිසාපතිගෙන් හෝ සුරාබදු කොමසාරිස්ගෙන් හෝ කල් ඇතිව ලබා ගත් අවසරය නැති ව වෙන් ද්‍රව්‍යයක් සෑදීම, සැපයීම හෝ විකිණීම පිළිබඳ කිසිම තනි උරුමයක් නැතහොත් ඒ සම්බන්ධයෙන් ඇති යම්කිසි අයිතියක් විකිණීම හෝ වෙන කෙනෙකුට පැවරීම හෝ නැවත බදුදීම හෝ නො කළ යුතුය. එසේ ම ආණ්ඩුවේ දිසාපතිගෙන් හෝ සුරා බදු කොම සාරිස්ගෙන් හෝ කලින් ලබා ගත් අනුමැතිය නැතිව, එබඳු යම් තනි උරුමයක් පාලනය කිරීම සඳහා, හෝ යම් කිසි සුරාබදු බලපත්‍ර යක අනුප්‍රරණ හිමිකම අත්සන් කිරීම සඳහා හෝ කිසිම නියෝජිත යකු හෝ ඇටෝර්නි බලකාරයකු හෝ පත් නොකළ යුතුය. හැම අවස්ථාවක දී ම එකී නියෝජිතයා නොහොත් ඇටෝර්නි බලකාරයා ලංකා පුරවැසියකු විය යුතුය. තවද ආණ්ඩුවේ දිසාපති විසින් හෝ සුරාබදු කොමසාරිස් විසින් එකී අනුමතිය දිය යුත්තේ ස්වකීය අභිමතය පරිදි විශේෂ අවස්ථාවල දී පමණකි.

(ආ) යම් බලපත්‍රධාරියෙකු විසින් බලපත්‍රයේ සඳහන් තැබෑරුම පවත්වාගෙන යෑම සඳහා ලංකාවේ පුරවැසියෙකු නොවන තැනැත්තෙකුගෙන් මුදලින් හෝ වෙනයම් කිසි ක්‍රමයකින් නියම ලෙස හෝ අනියම් ලෙස ආධාර ලබන බව යම් අවස්ථාවක ඔප්පු වුවහොත්, ඒ බලපත්‍රධාරියාට දෙනු ලැබූ බලපත්‍රය අවලංගු හා බල රහිත බව එකෙණෙහිම ප්‍රකාශ කළ යුතුය. එසේ වුවද කෘෂිකර්ම සඳහා මුදල් අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්ගෙන් කලින් ලිඛිත අවසරය බලපත්‍ර ධාරියා ලබාගෙන ඇතහොත්, පෙරකුව වූ කොන්දේසිය ඔහුට අදාළ නොවිය යුතුය.

13. බලපත්‍ර ලත් ස්ථාන විවෘත කොට තැබිය යුතු බව හා ඒවායේ සැහෙන බීම තොගයක් තිබිය යුතු බව.—(1) 6 වැනි කොන්දේසිය හෝ 10 වැනි කොන්දේසිය හෝ යටතේ තාවකාලික වශයෙන් වසා තැබීමට අවසර දී තිබෙනොත් මිස තැබෑරුම් ද නානායම් ද, පිට ගෙන් පරිභෝග කිරීමට සිල්ලරට මත්පැන් විකුණන සාප්පු ද, රෙස්ටෝරන්ට් ශාලාද, වතු කැන්ටීම් ද, විනෝද ආපනශාලා ද, බීර හා පෝටර් සාප්පු ද නියමිත කාලවේලාවන් ඇතුළත විවෘතව තැබිය යුතුවාත් හැර උචිත බලපත්‍රය යටතේ විකිණිය හැකි මත්පැන් වගී නොහොත් මත්පැන් වර්ග ප්‍රදේශයේ වුවමනා වත් සඳහා ඉතා අඩු ගණනේ මෙපමණ තිබිය යුතුය කියා සුරාබදු අධිකාරී යම්කිසි ප්‍රමාණයක් නියම කරනොත් ඒ ප්‍රමාණයට මත්පැන් නොයෙකුත් හැඩයේ සිල් බෝතල්වල වත් කොට හෝ වත් නොකොට හෝ බෝතල්වල වත්කොටත් නොකොටත් ඒ තැබෑරුම ඇතුළේ දිනපතා තබාගත යුතු වන අතර එසේ අවම මත්පැන් ප්‍රමාණයක් නියම කරමින් සුරාබදු අධිකාරී විසින් නිකුත් කරන දැන්වීම බලපත්‍ර ලත් ස්ථානයෙහි ප්‍රදර්ශනය කර තැබිය යුතුය. කෙසේ නමුදු සුරා බදු කොමසාරිස් මේ අවශ්‍යතාව යම්කිසි නානායමක් හෝ විනෝද ආපනශාලාවක් සම්බන්ධයෙන් අත්හැර දැමීමට ද හැකි වේ.

(2) ආණ්ඩුවේ දිසාපති විසින් නියම කරන දිනවලදී විවෘත නො කරන තැබෑරුම් බලපත්‍රලාභියන්ගේ වගකීම පිට යලින් කොන්දේසි කරනු ලැබිය හැකිය.

14. ණයට විකිණීම තහනම් බව; විකුණන්ව බැරිය කීම.—අත්පිට මුදලට මිස තැබෑරුම්වලදී මත්පැන් නොවිකිණිය යුතුය. මත්පැන් ගැනීමට හිමිකම් ඇති ඕනෑම කෙනකු මුදල් දී මත්පැන් ඉල්ලූ විට විකිණිය හැකි ප්‍රමාණය සීමා කරන යම්කිසි විශේෂ කොන්දේසියක් ඇතොත් ඊට යටත්ව ඒ මත්පැන් දීමට හැම බලපත්‍රලාභියකුම බැඳී සිටිය යුතුය.

**15. මත්පැන් විකිණිය හැකි අඩුම හා වැඩිම මිල ගණන් නොඉක්මවිය යුතු බව.**—එවකට වලංගු වන නීතියේ ප්‍රකාර මත්පැන් විකිණීම සඳහා යම්කිසි අඩුම මිලක් හෝ වැඩිම මිලක් නියම කර තිබෙතොත් ඒ අඩුම මිලට අඩුවෙන් හෝ වැඩිම මිලට වැඩියෙන් හෝ කිසිම මත්පැනක් විකිණිය යුතු නොවේ.

**16. ළඟ තබාගත හැකි වැඩිම ප්‍රමාණයත් විකිණිය හැකි අඩුම ප්‍රමාණයත් නොඉක්මවිය යුතු බව.**—බලපත්‍රයක් නැතිව ළඟ තබා ගැනීමට නියමිත ප්‍රමාණයට වඩා මත්පැන් එකවරට එක පුද්ගලයකුට, වලංගු අවසර පත්‍රයක් නැතිව, කිසිම බලපත්‍ර ලත් ස්ථානයකින් ඉවතට ගෙන යැමට ඉඩ නොදිය යුතුය. එසේ ම නියමිත අඩුම ප්‍රමාණයට වඩා අඩුවෙන් කිසිම ගුදමකදී හෝ ගබඩාවකදී මත්පැන් නොවිකිණිය යුතුය.

**17. දිනපතා ගණන් හිලව්.**—සුරාබදු කොමසාරිස් අනුමත කරන ආකාරයට ගනුදෙනු පිළිබඳ සැබෑ ගණන් හිලවු දවසින් දවස තීන්තෙන් ලියා බලපත්‍රය ලත් ස්ථානයෙහි තබාගත යුතුය. එක් එක් මාසය අවසානයේ දී එකී ගණන් හිලවු නිවැරදිවත් අප්‍රමාදවත් එකතු කළ යුතුය. ගණන් හිලවු හා අවසරපත්‍ර මුද්‍රිත පොත් වල ලිවිය යුතුය. මේ පොත් මුද්‍රණය කිරීමට ගිය මුදල ගෙවූ විට හෝ ඒ මුදල ආණ්ඩුවේ භාණ්ඩාගාරයට ගෙවූ බවට කුවිතාන්සි ඉදිරිපත් කළ විට ඕනෑම කච්චේරියකින් ලබාගත හැකි ය. ලැබුණු මත්පැන් සඳහා අවසර පත්‍රද, නිකුත් කළ අවසර පත්‍රවල උප පත්‍රිකා ද බලපත්‍ර ලත් ස්ථානයෙහි (ලියුම් මිටියකට බැඳ) ගොනු කොට පරිස්සමින් තබාගත යුතුය.

එක දවසක් තුළදී යම් බලපත්‍රලත් ස්ථානයකට ලැබුණු මත්පැන් ප්‍රමාණය ලියා තැබිය යුත්තේ එම දවස අවසානයේ දී වන හෙයින්, මත්පැන් භාරගත් දිනක බලපත්‍රලත් ස්ථානය පරීක්ෂා කරන ඕනෑම සුරාබදු නිලධාරියකුට එවැනි නිලධාරියකු පරීක්ෂණය කරන වේලාව දක්වා බලපත්‍ර ලත් ස්ථානයට ලැබුණු මත්පැන් පිළිබඳ ඉන්වොයිස් පත්‍ර, නිවේදනපත්‍ර හා/හෝ ප්‍රේෂණපත්‍ර පරීක්ෂා කරනු ලැබීම සඳහා ඉදිරිපත් කිරීම බලපත්‍රධාරියාගේ යුතුකම විය යුතුය.

පසුවට දෙන මත්පැන් වෙනුවෙන් කලින් හිස් අවසර පත්‍රිකාවක් අත්සන් කිරීම තහනම්ය. අවසර පත්‍රිකාවල උප පත්‍රිකාවත් ද විදේශීය මත්පැන් පිළිබඳ බලපත්‍ර සම්බන්ධයෙන් නම් ලැබුණු මත්පැන් සියල්ල වෙනුවෙන් ඉන්වොයිස් පත්‍රිකාවත් ද බලපත්‍රය වලංගු කාල පරිච්ඡේදය ගතවී එක් අවුරුද්දක් යනතුරු බලපත්‍රකරු විසින් සුරක්ෂිතව තබා ගෙන නිලයෙන් සුරාබදු දෙපාර්තමේන්තුවේ පරීක්ෂකවරයකුට පහත් නුවූ නිලධාරියකු ඉල්ලූ විට ඉදිරිපත් කළ යුතුය. රට බීම විකිණීම බලපත්‍ර ලත් තොග වෙළඳුන් විසින්, තොග වශයෙන් විකුණන ලද රටබීම පිළිබඳ ඉන්වොයිස් පත්‍රවල දෙවෙනි කාර්බන් පිටපත්, ඒ රටබීම තොගය විකුණූ දින සිට සත් දිනක් ඇතුළත දී ඒ ඒ කොට්ඨාශයේ සහකාර කොමසාරිස්ට යැවිය යුතුය.

ආපසු බාරදීම හෝ නිෂ්ප්‍රභවීම හෝ කාලය ගෙවීයෑම හෝ වෙන යම්කිසි හේතුවක් නිසා බලපත්‍රය අවලංගු වී දවස් තුනක් ඇතුළත දී හෝ එසේ කරන මෙන් නියම කොට දවස් තුනක් ඇතුළත දී බලපත්‍රලාභියා විසින් මේ කොන්දේසියේ විධි විධානයන් යටතේ තබා ගන්නා ගණන් හිලවු පිළිබඳ සියලු පොත් පත් ද 21 වැනි කොන්දේසියේ සඳහන් පරීක්ෂණ පිළිබඳ සටහන් පොතද බලපත්‍රය ලත් ස්ථානය පිහිටි ප්‍රදේශය බාර ප්‍රාදේශීය අධිකාරිට බාරදිය යුතුය.

**18. බලපත්‍රලාභීන් විසින් වාර්තා ආදිය යැවිය යුතු බව.**—බලපත්‍රලාභීන්, ඔවුන්ගේ නියෝජිතයන් හා ඒජන්තවරුන් හා සේවකයන් යන මොවුන් හෝ ඔවුන්ගෙන් කිසිවකු ආණ්ඩුවේ දිසාපති හෝ සුරාබදු දෙපාර්තමේන්තුවේ පරීක්ෂකවරයෙකුගේ ශ්‍රේණියට නොඅඩු නිලධරයකු ලියවිල්ලකින් නොහොත් කට වචනයෙන් ඉල්ලන ඕනෑම වාර්තාවක් හෝ තොරතුරක් නිවැරදිවත් අප්‍රමාදවත් සැපයීමට බැඳී සිටිය යුතුය.

**19. පාවිච්චි කළ යුත්තේ නොහොත් තබාගත යුත්තේ සම්මත තරාදි පඩි හා මිමි බව.**—බලපත්‍රයක් ලත් යම්කිසි ස්ථානයක පාවිච්චි කිරීම සඳහා යම් යම් තරාදි පඩි මිමි හෝ උපකරණ නියම කර ඇති විට ඒ ස්ථානයෙහි තබාගත යුත්තේ නොහොත් පාවිච්චි කළ යුත්තේ ඒ නියම කරන තරාදි පඩි මිමි හා උපකරණ පමණකි. දිස්ත්‍රික්කයේ තරාදි පඩි ආදියේ මුද්දර ගසන ආයතනය ලවා ඒ තරාදි පඩි ආදිය පරීක්ෂා කරවාගෙන ඒවායේ මුද්දර ගස්සවා ගත යුතුයයි ආණ්ඩුවේ දිසාපති නියම කළොත් එසේ කරවා ගත යුතුයි. බලපත්‍රයක් ලත් යම්කිසි ස්ථානයක හොර තරාදි පඩි හෝ මිමි තබා ගතහොත් නැතහොත් පාවිච්චි කළොත් බලපත්‍රලාභියා දඬුවම් ලැබීමට යටත්වනු ඇත.

**20. පරීක්ෂා කිරීමට බලය ලත් අය හා ඔවුන්ගේ බලතල.**—බලපත්‍ර ලත් ස්ථාන පරීක්ෂා කිරීමට බලය ලත් නිලධරයන් නම්—

(1) ප්‍රාදේශීය ආදායම් පාලක නිලධරයකුගේ හෝ එවැනි තත්ත්වයක වෙන නිලධරයකුගේ තත්ත්වයට පහළ නුවූද ආදායම් පිළිබඳ දෙපාර්තමේන්තුවේ වැඩ කරන්නාවූද, නිලධරයෙක් ;

(2) සුරාබදු දෙපාර්තමේන්තුවේ පරීක්ෂකවරයකුගේ තත්ත්වයට පහත් නුවූ නිලධරයෙක් ; හා

(3) (52 වැනි අධිකාරයේ) සුරාබදු ආඥාපනතේ 33 වැනි, 35 වැනි හා 48 (අ) වැනි වගන්තිවල සඳහන් කටයුතු හා රාජකාරි ඉටුකිරීමට 7 (ආ) වැනි වගන්තිය යටතේ පත් කරන ලද යම් තැනැත්තෙක් ; වෙති.

මෙ නිලධරයන්ට—

(අ) ස්ථානයට ඇතුල් වී සෝදිසි කර බැලීමටද ;

(ආ) පාවිච්චි කරන තරාදි පඩි හා මිමිත් බලපත්‍රලාභියා ළඟ තිබෙන මත්පැන් හා මද්‍යසාර ඖෂධත් පරීක්ෂා කිරීමටද ;

(ඇ) රසායනික විග්‍රහයක් කිරීමට හෝ තත්ත්වය හෝ සැර පිළිබඳ සැකයක් ඇති වූයෙන් පරීක්ෂා කිරීමට ඒ ස්ථානයෙන් ඒ මත්පැනෙන් හෝ මද්‍යසාර ඖෂධයෙන් ස්වල්පයක් සැම්පලයක් වශයෙන් ගෙන භාජනයකට දමා බලපත්‍රලාභියා හෝ ඔහුගේ බලය පවරණු ලැබූ සේවකයා ඉදිරියේ දීම විධිවූ පරිදි සිල් තබා ඒ හා සමාන කොටසක් බලපත්‍රලාභියාට හෝ ඔහුගේ බලය පවරණු ලැබූ සේවකයාට ද දී මුදල් ගෙවීමක් නොකොට ගෙන යැමටද ; බලපත්‍රධාරියා හෝ ඔහු විසින් බලය පවරණු ලැබූ ඔහුගේ සේවකයා, විසින් ඔවුන්ට භාරදෙන ලද සැම්පලයක් කිසිම ආකාරයකින් විකෘතියට පත් නොකිරීමෙන් සහ ඒවාට තබන ලද මුද්‍රා වලට හානි නොකිරීමෙන් බාර දෙන ලද ආකාරයෙන්ම ඒවා ආරක්ෂා කර තැබිය යුතුය ;

(ඈ) සිමට හෝ පව්ච්චියට නුසුදුසුයයි හෝ අතපත ගාන ලද්දේයයි හෝ සැක කිරීමට සෑහෙන තරම් හේතු ඇති ඕනෑම මත්පැනක් හෝ ඒ ස්ථානයෙහි තිබෙන යම් මද්‍යසාර ඖෂධ වර්ගයක් විකිණීම නැවැත්වීමටද ;

(ඉ) බලපත්‍රය ලත් ස්ථානයෙහි තබා තිබෙන ගණන් හිලවු ඉල්ලා ඒවා පරීක්ෂා කිරීමටද ;

(ඊ) බලපත්‍රය ලත් ස්ථානයෙහි තිබෙන බිල්පත්‍ර, ඉන්වොයිස් හා පොත් පත් තහනම් කිරීමටද ;

(උ) සුරාබදු ආඥාපනතේ විධිවිධානත් බලපත්‍රයට යාකොට ඇති කොන්දේසිත් බලපත්‍රලාභියා ලවා පිළිපැද්දවීම වශයෙන් රාජකාරිය ඉටු කිරීමට අවශ්‍ය වන සෙසු කටයුතු කිරීමටද ;

බලය ඇත්තේ ය.

(බිර යා පෝටර පමණක් විකිණීමට බලපත්‍ර ලත් සථානද ඇතුළු) තැබෑරුම් සම්බන්ධයෙන් වූ විට ඒ ස්ථානවල යම් පෞද්ගලික ලිපි ලේඛන හෝ පොත් පත් ආදියක් ඇතොත් ඒවා සෝදිසි කර බැලීමටද එසේ සෝදිසි කර බැලීමේදී යම් වරදක් කෙරී ඇති බවක් පෙනී ගියොත් ඒ ලිපි ලේඛන හෝ පොත් පත් ආදිය තහනම් කොට ඉවතට ගෙන යැමටද එකී නිලධරයන්ට බලය තිබේ.

සියලු බලපත්‍රලාභීන් විසින් ඒ නිලධරයන් සියලු දෙනාට ඔවුන්ගේ බලතල ක්‍රියාවේ යෙදවීම සඳහා වුවමනා වන සියලු පහසුකම් හා උදවු උපකාර දිය යුතුය.

නීතියෙන් පොලිස් නිලධරයන් කෙරෙහි පැවරී ඇති බලතල කිසිවක් මේ කොන්දේසිය නිසා නැතිවී යන්නේ යයි තේරුම් නොගත යුතුය. මේ කොන්දේසිය යටතේ සැම්පල් වශයෙන් ස්ථානයෙන් පිටතට ගෙන යන මත්පැන් ආදියේ වටිනාකම පිළිබඳ වන්දියක් ඉල්ලීමට ඉඩක් නැති විය යුතුය.

**21. පරීක්ෂණ සටහන් පොත.**—පරීක්ෂක නිලධාරීන් විසින් කිය යුතු කරුණු ලිවීම පිණිස බලපත්‍රලාභියා විසින් සුරාබදු අධිකාරි දුන් පරීක්ෂණ සටහන් පොත් බලපත්‍ර ලත් ස්ථානයෙහි තබා ගත යුතුවාත් හැර ඊට කුවිතාන්සියක් දුන් විට එය සුරාබදු අධිකාරිට හෝ එය බාරගැනීමට ඔහු විසින් බලය පවරන ලද වෙන යම් නිලධරයකුට හෝ බාර දිය යුතුය. බලපත්‍ර ලත් ස්ථානයෙහි ඒ සටහන් පොතක් තබා ගියොත් බලපත්‍රලාභියා විසින් ඊට කිසිම හානියක් වෙන්නට ඉඩ නොදී එය සුරක්ෂිතව තබාගත යුතුය.

**22. ස්වකීය සේවකයන් නියෝග උල්ලංඝනය කළොත් එය බලපත්‍රලාභීන් විසින් රිපෝර්තු කළ යුතු බව.**—මත්පැන් නිෂ්පාදනය කිරීම හෝ ගෙනයෑම හෝ විකිණීම සඳහා සේවයෙහි යොදවා සිටින අය සුරාබදු නීති උල්ලංඝනය කරන බැව් තමන්ට දැනගන්නට ලැබෙන හැම අවස්ථාවකදීම ඒ බැව් සුරාබදු අධිකාරීට රිපෝර්තු කිරීමටත් එබඳු අයට දිගටම රක්ෂාවදීම සම්බන්ධයෙන් අධිකාරි විසින් නිකුත් කරන ආඥාවන් පිළිපැදීමටත් බලපත්‍රලාභීහු බැඳී සිටිති. ලංකාවේ දණ්ඩනීති සංග්‍රහය යටතේ හෝ සුරාබදු ආඥාපනත යටතේ හෝ වරදකරුවකු වූ කිසිවකු අධිකාරීගෙන් කලින් ලබාගත් අනුමතිය නැතුව මත්පැන් ගෙනයාම හෝ විකිණීම සඳහා සේවයෙහි නොයෙදවිය යුතුය.

**23. බලපත්‍රලාභීන් හා සුරාබදු නිලධරයන් අතර මුදල් ගනුදෙනු කිරීම තහනම් බව.**—බලපත්‍රලාභීන් ඔවුන්ගේ නියෝජිතයන් හා ඒජන්තවරුන් හා සේවකයන් යන මොවුන් හා සුරාබදු දෙපාර්තමේන්තුවේ නිලධරයන් අතර මොනම අන්දමේ වුවත් මුදල් ගනුදෙනුවක් කිරීම සම්පූර්ණ වශයෙන් තහනම්ය.

24. (1) **බලපත්‍ර ලත් ස්ථානයත් භාජන ආදියත් පවිත්‍රව තබාගත යුතු බව.**—බලපත්‍ර ලත් ස්ථානයත් එහි මත්පැන් වත්කර තැබීමට හෝ විකිණීමට හෝ ඒ ස්ථානයට මත්පැන් ගෙන ඊමට පාවිච්චි කරන භාජන මිම් හා සෙසු බඩුත් හොඳටම පිරිසිදුව තබාගත යුතුය.

(2) **(කන බොන) පිගන් කෝප්ප ආදිය සේදීම.**—පාරිභෝගික යන්ට මත්පැන් හෝ ආහාර දීම සඳහා පාවිච්චි කරන වීදුරු, මිම්, භාජන, උපකරණ යන මේ ආදි සියලු දේ පාවිච්චි කොට අපසු දුන් වහාම පිරිසිදු වතුරෙන් සෝදා වතුර බේරීයන පරිද්දෙන් හිල් සහිත රාක්කයක් උඩ මුණින් නමා තබා පිරිසිදු රෙදි කඩකින් පිස දැමිය යුතුය. බලපත්‍ර ලත් ස්ථානය වැසුවාට පසු දිනපතා ඒ රෙදි කඩ සබන් හා වතුරෙන් සේදිය යුතුය.

(3) **බලපත්‍ර ලත් ස්ථානයෙහි වතුර කරාම ආදිය තැබිය යුතු බව.**—සුරාබද්ද අධිකාරි නියම කළොත් පොදු ජල සම්පාදන සේවයක් ඇති යම්කිසි නගරයක හෝ ස්ථානයක පිහිටි බලපත්‍ර ලත් මද්‍යශාලාවක ගොඩනැඟිලිවල සුදුසු ලෙස වතුර කරාමත්, සෝදන භාජනත්, වතුර බැස යාමට කාණු හෝ නලත්, ඔවුන් සෑහීමකට පත්වන අයුරින් දම්මවා හෝ සවිකර ගත යුතුය. .

(4) **කෑමට හා බීමට ගන්නා භාජන සේදීම සඳහා වතුර වත්කර තැබීමට භාජන සැපයීම.**—මේ කොන්දේසියේ (3) වැනි ඡේදය යටතේ දැසිප්ප ආදිය දම්මවා ගැනීම අවශ්‍ය නොවන බලපත්‍ර ලත් හැම ස්ථානයකම පාවිච්චි කරනු ලැබූ වීදුරු, මිම්, භාජන උපකරණ හා බඩුත් යන මේවා සියල්ල සේදීම පිණිස සෑහෙන තරම් පිරිසිදු වතුරත්, සේදූ වතුර නොහොත් ඉඳුල් වතුර වත් කිරීමට නව භාජනයක් හෝ භාජන කීපයකුත් තිබිය යුතුය. ඒ ඉඳුල් වතුර වත් කරන භාජන කලින් කල හිස් කළ යුතුය. පිරිසිදු වතුර වත් කරන භාජනය ලෝහමය භාජනයක් විය යුතුය. එහි කට භාජනයේ මහතටම තිබිය යුතුය. එහෙත් කට සම්පූර්ණයෙන්ම වැසීමට බුරුල් පියනක් තිබිය යුතුය. එපමණක්ද නොව ඒ භාජනය පතුලේ ඇබයක් (කරාමයක්) සවි කොට තිබිය යුතුය. ඒ භාජනයෙහි ගැලොම් 4ට නොඅඩු තරම් වතුර වත්කර තැබීමට පුළුවන් විය යුතුය. පිගන් කෝප්ප ආදිය සේදීමට වතුර ගැනීමට තරම් පහසු උස ඇති තට්ටුවක් උඩ එය තැබිය යුතුය.

(5) බලපත්‍ර ලත් ස්ථානයෙහි ස්වභාවය හා පිහිටීම අනුව ඉඩ තිබෙනොත් කුණු වතුර හෝ ඉඳුල් වතුර වත්කරන භාජනය නොහොත් භාජන වෙනුවට සේදීමට පාවිච්චි කරන වතුර පහසු වෙන් වත් කිරීමට පුළුවන් වන පරිද්දෙන් සුරාබද්ද අධිකාරි නියම කරන පිළිවෙලකට හුණු බදාමෙන් බැඳ උළින් සිමෙන්ති හා කපරාරු කරන ලද්දාවූද, වර්ග ප්‍රමාණයෙන් එකක් වර්ග අඩි හතරකට අඩු නුවූද ගොඩනැඟිල්ලේ පිටුපස බිත්තියෙන් හෝ පැති බිත්තියෙන් හෝ වතුර පිටවී යාමට අඩු වශයෙන් අඟල් දෙකකවත් විෂ්කම්භය ඇති නළ සවිකරන ලද්දාවූද වැන්කියක් නොහොත් වැන්කි කීප යක් බඳවා ගත යුතුය.

(6) සෙනෙකු පාවිච්චි කළ කිසිම වීදුරුවක් හෝ මිම්මක් හෝ භාජනයක් හෝ උපකරණයක් හෝ බඳුනක් පිරිසිදු වතුර තිබෙන කිසිම භාජනයකට සේදීම පිණිස දැමීම හෝ ගිල්ලීම හෝ නොකට යුතුය. එහෙත් ඇතුළතු පිටත දෙකම හොඳින් සේදී යන පරිදි පාවිච්චි කළ ඒ වීදුරුව හෝ මිම්ම හෝ භාජනය හෝ උපකරණය හෝ බඳුන සේදිය යුත්තේ කරාමයෙන් නොහොත් ඇබය සවි කළ සිදුරෙන් වතුර වැක් කිරීමට සලස්වා ඒ වතුරට ඇල්ලීමෙනි.

25. **අතිරේක පොදු නියෝග පිළිපැදිය යුතු බව.**—සුරාබද්ද ආඥා පනතෙන් හෝ සුරාබද්ද ආඥාපනත යටතේ අතිරේක පොදු නියෝග පැන වුවහොත් ඒවා පිළිපැදීමටත් ආණ්ඩුවේ දිසාපති හෝ ඔහුගෙන් බලයලත් යම් නිලධරයකු නියම කළොත් සංශෝධනය කිරීම පිණිස හෝ අලුත් බලපත්‍ර නිකුත් කිරීම පිණිස තමන්ගේ බලපත්‍ර ඉදිරිපත් කිරීමටත් බලපත්‍ර ලත් සියලුදෙනා බැඳී සිටිය යුතුය.

26. **බලපත්‍ර ලත් ස්ථානයක හැර වෙන ස්ථානයක මත්පැන් ආදිය විකිණීම හෝ තබාගැනීම තහනම් බව.**—(බලපත්‍ර නොලත් අය සම්බන්ධයෙන් අදාළවන නීතිය යටතේද ඒ නීතියට එකඟවද මිස නැතිනම්) කිසිම බලපත්‍රලාභියකු හෝ ඔහුගේ නියෝජිතයකු හෝ ඒජන්ත කෙනකු හෝ සේවකයකු විසින්, සුරාබද්ද පනතට යටත් කිසිම ද්‍රව්‍යයක් බලපත්‍රය අදාළවන ස්ථානයෙන් පිට කිසිම තැනක තබාගැනීම හෝ තබාගෙන විකිණීම තහනම්ය.

27. **විශේෂ අවසරයක් නැතිව බලපත්‍ර ලත් ස්ථානයෙන් පිටතට (මත්පැන් ආදිය) ගෙනයෑම තහනම් බව.**—ආණ්ඩුවේ දිසාපතිගෙන් ලබාගත් විශේෂ අවසරයක් නැතිව අරක්කු තැබෑරුමක හෝ රා තැබෑරුමක හෝ විදේශීය මත්පැන් තැබෑරුමක බලපත්‍රලාභියා විසින් ඒ තැබෑරුමේදී විකිණිය හැකිව තිබුණු කිසිම මත්පැනක් ඒ තැබෑරුමෙන් පිටතට තමාම නියෝජිතයකු යවා ගෙන යෑම මොනම අවස්ථාවකදීවත් නොකට යුතුය.

28. **භාජනවලට නොම්මර තැබිය යුතු බව හා ඒවායේ අල්ලන ප්‍රමාණයන් ලකුණු කළ යුතු බව, බැල්තු මිම් තිබිය යුතු බව.**—අරක්කු රේන්දකරුගේ හැම ගබඩාවකත්, හැම අරක්කු තැබෑරුමක හෝ රා තැබෑරුමක හෝ විදේශීය මත්පැන් තැබෑරුමකත්, හැම අරක්කු කැන්ටිමකත්, හැම රා කැන්ටිමකත්, හැම ඉස්කාගාරයකත් මත්පැන් කවර වර්ගයක් වුවත් සාදන හැම ස්ථානයකත් තැබෑරුම් විනාකිරි පෙරන ස්ථාන, ඉස්කාගාර යන මේවාට රා එකතු කරන හැම ස්ථානයකත්, විනාකිරි පෙරන හැම ස්ථානයකත්, හැම විනාකිරි ගබඩාවකත්, බීර හෝ පෝටර් විකුණන හැම ස්ථානයකත්, හැම රෙස්ටෝරන්ට් ශාලාවකත්, හෝටලයකත්, හෝටල් ආපන ශාලාවකත්, මත්පැන් විකුණන හෝ බරණිවලට හෝ පීප්පවලට මත්පැන් ගබඩා කර ඇති වෙනයම් බලපත්‍ර ලත් ස්ථානයකත් මත්පැන් වත්කර තැබීමට නොහොත් ගෙන යාමට පාවිච්චි කරන සෑම භාජනයකම—

(අ) අනුක්‍රමාංකයද, ගැලුම්වලින් හා ගැලුම් භාගවලින් එහි අල්ලන ගැලුම් ගණනද පැහැදිලි ලෙස පිට පැත්තේ කොටා සායම් කොට තිබිය යුතුය;

(ආ) ඒ හැම භාජනයකටම නිවැරදි බැල්තු මිම්මක් බැගින් තිබිය යුතුය. ඒ බැල්තු මිම්ම අයිති භාජනයේ අනුක්‍රමාංකය ඒ ඒ බැල්තු මිම්ම උඩ කෙළවරෙහි පැහැදිලි ලෙස කොටා සායම් කොට තිබිය යුතුය. භාජනයේ අල්ලන මත්පැන් මනින්නේ ගැලුම්වලින් නම් පළමු වැනි ගැලුම වැටෙන්නේ අසවල් තැනටය. ගැලුම් භාගවලින් නම් පළමුවැනි ගැලුම් භාගය වැටෙන්නේ අසවල් තැනටය, කියා ඒ බැල්තු මිම්මේ පළමු වැනි ඒකකය හැඟවීමට ලකුණක්ද එමෙන් ම පළමුවැනි මිණුම් ලකුණට ඉහළින් භාජනයේ අල්ලන සම්පූර්ණ මත්පැන් ප්‍රමාණය පියවන තුරු එක් එක් මිණුම් ඒකකය හැඟවීමට ලකුණුද ඒ බැල්තු මිම්මේ තිබිය යුතුය. මිනුම් ඒකකය කුමක්ද යන වග පළමුවැනි ලකුණට ඉහළින් කොටා තිබිය යුතුය.

(2) **බලපත්‍ර ලත් ස්ථානයේ බැල්තු මිම් තබාගත යුතු බව; පීප්ප වලට එක විදියේ යතුරු දෙකක් බැගින් තිබිය යුතු බව.**—අරක්කු රේන්දකරුගේ ගබඩාවල්, අරක්කු තැබෑරුම් හෝ රා තැබෑරුම්, ඉස්කාගාර, කොයි මත් පැන් වර්ග වුවත් පෙරන ස්ථාන, එකතු කරන ස්ථාන, විනාකිරි පෙරන නොහොත් ගබඩා කරන ස්ථාන, බීර හා පෝටර් විකුණන ස්ථාන යන මේ හැමතැනකම එක් එක් පීප්පය නොහොත් භාජනය සඳහා සපයා ඇති බැල්තු මිම්ම බලපත්‍ර ලත් ස්ථානයෙහි කොයි විටත්, තබාගත යුතුය. එකී හැම පීප්පයකටම එක විදියේ යතුරු දෙකක් තිබිය යුතුය. ඉන් එකක් සුරාබද්ද අධිකාරි බාරයෙහි තිබිය යුතුය.

(3) **භාජන එහා මෙහා ගෙනයන විට බැල්තු මිම්ද ගෙන යා යුතු බව.**—එකී යම් භාජනයක්, පීප්පයක් හෝ පසසු බඳුනක් ඉවත ගෙන යන විට ඒ භාජනයට හෝ පීප්පයට හෝ බඳුනට අයිති බැල්තු මිම්මද එය ගෙනයන රථයෙන්ම ගෙන යා යුතුය.

9-381

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව, එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවට ද හේතු වන බව සලකන්න.

ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ, මහලේකම් කාර්‍යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්‍යාංශයේ අධිකාරි වෙත කෙළින්ම ගෙවිය යුතුයි.

### උපලේඛනය

### 1970

| මාසය | පළ කිරීමේ දිනය | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|
| ජූලි | 70. 7. 2 බ්‍රහස්පතින්ද | 70. 6.25 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70 7 10 සිකුරාද | 70 7 2 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70. 7.17 සිකුරාද | 70. 7.10 සිකුරාද | දහවල් | 12.0 |
| | 70. 7.24 සිකුරාද | 70. 7.17 සිකුරාද | දහවල් | 12.0 |
| | 70. 7.31 සිකුරාද | 70. 7.24 සිකුරාද | දහවල් | 12.0 |
| අගෝස්තු | 70. 8. 7 සිකුරාද | 70. 7.30 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 70. 8.14 සිකුරාද | 70. 8. 7 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 8.21 සිකුරාද | 70. 8.14 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 8.28 සිකුරාද | 70. 8.21 සිකුරාද | ප.ව. | 3.30 |
| සැප්තැම්බර් | 70. 9. 4 සිකුරාද | 70. 8.28 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 9.11 සිකුරාද | 70. 9. 4 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 9.18 සිකුරාද | 70. 9.11 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 9.25 සිකුරාද | 70. 9.18 සිකුරාද | ප.ව. | 3.30 |
| ඔක්තෝබර් | 70.10. 2 සිකුරාද | 70. 9.25 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.10. 9 සිකුරාද | 70.10. 2 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.10.16 සිකුරාද | 70.10. 9 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.10.23 සිකුරාද | 70.10.16 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.10.30 සිකුරාද | 70.10.23 සිකුරාද | ප.ව. | 3.30 |
| නොවැම්බර් | 70.11. 5 බ්‍රහස්පතින්ද | 70.10.30 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.11.12 බ්‍රහස්පතින්ද | 70.11. 5 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70.11.20 සිකුරාද | 70.11.12 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70.11.27 සිකුරාද | 70.11.20 සිකුරාද | දහවල් | 12.0 |
| දෙසැම්බර් | 70.12. 4 සිකුරාද | 70.11.27 සිකුරාද | දහවල් | 12.0 |
| | 70.12.11 සිකුරාද | 70.12. 4 සිකුරාද | දහවල් | 12.0 |
| | 70.12.18 සිකුරාද | 70.12.10 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 70.12.24 බ්‍රහස්පතින්ද | 70.12.17 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 70.12.31 බ්‍රහස්පතින්ද | 70.12.24 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1970 මාර්තු 5 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපතිගේ දෙපාර්තමේන්තුව, කොළඹ.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයාධිපතිගේ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.